සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2017**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 9 | විෂයය / பாடம் / Subject: නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- .......................................................................................... විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව II උඩරට නර්තනය III පහතරට නර්තනය IV සබරගමු නර්තනය යන කොටස්වලින් ඔබ හදාරණ කොටස තෝරාගෙන ප්‍රශ්න 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

## I කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) භාව ප්‍රකාශනයෙන් අදහස් ප්‍රකාශ කිරීම හඳුන්වන්නේ,
   (1) ආංගික අභිනය නමිනි.
   (2) වාචික අභිනය නමිනි.
   (3) සාත්වික අභිනය නමිනි.
   (4) ආහාර්ය අභිනය නමිනි.

(02) සරඹ නර්තනයේ දී ත්‍රිවිධ ලය අප හඳුන්වන්නේ,
   (1) සමගුණ, දෙගුණ, තුන්ගුණ වශයෙනි.
   (2) විලම්භ, මධ්‍ය, ද්‍රැත වශයෙනි.
   (3) සුළු, මහ, මැදුම් වශයෙනි.
   (4) නෘත, නෘත්‍යය, අතිද්‍රැත වශයෙනි.

(03) නර්තන සම්ප්‍රදායයන් තුනට ම පොදු ශාන්ති කර්මය වනුයේ,
   (1) කොහොඹා කංකාරිය ය.   (2) බලි ශාන්ති කර්මය ය.
   (3) කෝලම් ය.   (4) දෙවොල් මඩුව ය.

(04) අතිශයෝක්තියෙන් යුතුව වර්ණනා කරන බුදුන්,දෙවියන්, රජුන් මුල් කරගෙන රචනා වී ඇති ගායනා විශේෂයකි.
   (1) ග්‍රහ පන්ති කවි   (2) ඇඹුම් කවි
   (3) ප්‍රශස්ති ගායනා   (4) මල් යහන් කවි

(05) 'රන් ගිරි ගිරි ගිගිරි ගිගිරි.....' මෙම ගීතය වඩාත් සුදුසු වන්නේ,
   (1) රිද්මයානුකූල චලන සඳහා ය.
   (2) තාලානුකූල චලන සඳහා ය.
   (3) ප්‍රකාශනාත්මක චලන සඳහා ය.
   (4) භාවාත්මක චලන සඳහා ය.

Department of Education – Western Province

- **A කොටසට අදාළ වගන්ති වලට සුදුසු වචනය දී ඇති පිළිතුරු වලින් තෝරා B කොටසෙහි ඇති හිස්තැන සම්පූර්ණ කරන්න.**

| **A** | **B** |
|---|---|
| (06) ග්‍රහ පන්ති ගායනයේ දී තාල තැබීමට උපයෝගී කරගනු ලබන්නේ, | ....................................... |
| (07) සිංහල ගැමි නැටුම්වල ලී කෙළි නැටුමට සමානකමක් දක්වන ද්‍රවිඩ ගැමි නැටුම | ....................................... |
| (08) 'සඳවට තරුවැල් ඇවිදින් කල එළි සද්දේ....' මෙය | ....................................... |
| (09) කාවඩි නර්තනයේ දී උපයෝගි කරගනු ලබන වාද්‍ය භාණ්ඩයකි. | ....................................... |
| (10) දළදා පෙරහැරේ කාන්තා නියෝජනය දක්නට ලැබෙන දේවාල පෙරහැර වන්නේ, | ....................................... |

( අත්මිණිය , තවිල් , තාලම් , පත්තිනි , කෝලාට්ටම් )

- **පහත සඳහන් වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

(11) තාලය පදනම් කරගෙන සිදු කෙරෙන ක්‍රියාවලියකි ප්‍රස්තාරකරණය. ( )

(12) සමූහ වාදනයක දී කණ්ඩායම් වශයෙන් සහසම්බන්ධතාව පවත්වා ගැනීම වැදගත් වේ. ( )

(13) මුරුගන් දෙවියන් උදෙසා විශේෂ වූ ගැමි නැටුමකි කෝලාට්ටම් ( )

(14) දළදා පෙරහැරෙහි වස් දොස් දුරුවීම සඳහා බලි යකුන් නැටීම කරනු ලබයි. ( )

(15) රිද්මය හා රේඛා, නර්තනය හා චිත්‍ර කලාව කෙරෙහි සෘජු වශයෙන් සම්බන්ධ නොවන අංග දෙකකි. ( )

Department of Education – Western Province

## <u>II උඩරට නැටුම්</u>

(16) දොළොස්වන පා සරඹ පදය නටා අවසන් කරනුයේ,

(1) කස්තිරමෙන් ය. (2) හමාර පදයෙන් ය.
(3) ඉරට්ටියෙන් ය. (4) කලාසමෙන් ය.

(17) නෛඅඩි වන්නමේ තුන්වන කවියේ මුල් වචන පෙළ වනුයේ,

(1) නා කොළ අන්දම් පෙන
(2) ලෝ තුල රන්දම් සිරිනි
(3) බෝ කොළ අන්දම් පෙනය
(4) අන්දමකින් ඉඳ පෙනය

(18) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ සිදු කෙරෙන චාරිත්‍ර වේ.

(1) කප් සිටුවීම, මඩු පේ කිරීම
(2) තොටමෙට යාම, පිදේනි ඔප්පු කිරීම
(3) මිල්ල කැපීම, හගල යැදීම
(4) පිදේනි ඔප්පු කිරීම, හගල යැදීම

(19) ශාස්ත්‍රීය පද විශේෂයක් වශයෙන් නර්තනය කරනු ලබන හත්පද පෙළපාලිය දැකිය හැක්කේ,
(1) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ දී
(2) පහන් මඩු ශාන්ති කර්මයේ දී
(3) බලි ශාන්ති කර්මයේ දී
(4) කිරිමඩු ශාන්ති කර්මයේ දී

(20) 1952 වසරේ රජයේ ලලිත කලායතනයේ විදුහල්පති ධූරය දැරූ නර්තන ශිල්පියෙකු වන්නේ,
(1) කේ. එස්. ප්‍රනාන්දු ගුරුතුමා
(2) ජී. වී. හීන් නිලමේ ගුරුතුමා
(3) මුදියන්සේ දිසානායක ගුරුතුමා
(4) එස්. පණීභාරත ගුරුතුමා

(ලකුණු 20)

## III පහතරට නැටුම්

(16) දොළොස්වන පා සරඹ පදය නටා අවසන් කරනුයේ,
(1) කස්තිරමෙන් ය.
(2) හමාර පදයෙන් ය.
(3) ඉරට්ටියෙන් ය.
(4) කලාසමෙන් ය.

(17) මාත්‍රා 3 + 4 දෙතිතට අයත් සරල කවි තාලයේ තුන්වන පදයේ මුල් වචන පෙළ වනුයේ,
(1) මිහිපිට රන්තරු දිලිසෙන්නා
(2) වලා යටින් සඳ පායන්නා
(3) ඇතුන් අසුන් තුරඟ සේසත්
(4) නිමල දහම් අපෙ සූරිය

(18) දෙවොල් මඩු ශාන්ති කර්මයේ දී සිදු කෙරන චාරිත්‍ර වේ.
(1) තොටමෙට යාම, පිදේනි ඔප්පු කිරීම
(2) අයිලෙ සැදීම, තොට මෙට යාම
(3) අයිලෙ යැදීම, මිල්ල කැපීම
(4) හගල පේ කිරීම. අයිලෙ යැදීම

(19) ඇතැම් ගද්‍ය කොටස් පද්‍ය ආකාරයෙන් ගායනය කරමින් ඉදිරිපත් කෙරෙන අස්නෙ නර්තනය දැකිය හැක්කේ,
(1) පහන් මඩු ශාන්ති කර්මයේ දී
(2) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ දී
(3) බලි ශාන්ති කර්මයේ දී
(4) දෙවොල් මඩු ශාන්ති කර්මයේ දී

(20) සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ පහතරට නැටුම් උපදේශකවරයෙකු ලෙස කටයුතු කළ ශිල්පියෙකු වන්නේ,
(1) එස්. පණීභාරත ගුරුතුමා
(2) ජී. වී. හීන් නිලමේ ගුරුතුමා
(3) මුදියන්සේ දිසානායක ගුරුතුමා
(4) කේ. එස්. ප්‍රනාන්දු ගුරුතුමා

Department of Education – Western Province

## IV සබරගමු නැටුම්

(16) දොළොස්වන දොඹින පදය නටා අවසන් කරනුයේ,

(1) කස්තිරමෙන් ය. (2) හමාර පදයෙන් ය.

(3) ඉරට්ටියෙන් ය. (4) කලාසමෙන් ය.

(17) මණ්ඩුක වන්නමේ තුන්වන කවියේ මුල් වචන පෙළ වනුයේ,

(1) උදහස් වී රිවි පායන විලසට

(2) අවිය රැගෙන යුදයට ආ විලසට

(3) අහස් කුසේ වැසි ගුවනින්

(4) හයියෙන් කීවොත් වන්නම

(18) පහන් මඩු ශාන්ති කර්මයේ දී සිදු කෙරෙන චාරිත්‍ර වේ.

(1) මඩු පේ කිරීම, තොට පේ කිරීම

(2) අයිලෙ යැදීම, තොට මෙට යාම

(3) අයිලෙ යැදීම. මිල්ල කැපීම

(4) හඟල පේ කිරීම. අයිලෙ යැදීම

(19) සුවිශේෂී නර්තන අවස්ථාවක් වශයෙන් බිසෝ කප සිටුවීම දැකිය හැක්කේ,

(1) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ දී

(2) දෙවොල් මඩු ශාන්ති කර්මයේ දී

(3) පහන් මඩු ශාන්ති කර්මයේ දී

(4) බලි ශාන්ති කර්මයේ දී

(20) සමන් දේවාලයේ දේවාභරණ වැඩමවීමේ දී මංගල දවුල් වාදනය ඉටු කිරීමේ කාර්ය භාරය කළ ශිල්පියෙකු වන්නේ,

(1) එස්. පණිභාරත ගුරුතුමා

(2) කේ. එස්. ප්‍රනාන්දු ගුරුතුමා

(3) මුදියන්සේ දිසානායක ගුරුතුමා

(4) ජී. වී. හීන් නිලමේ ගුරුතුමා

(ලකුණු 20)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

- නර්තන කලා නිර්මාණ ප්‍රදර්ශන යටතේ නර්තන ප්‍රසංගයක් සැලසුම් කිරීම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) (1) නර්තන ප්‍රසංගයක් සැලසුම් කිරීමේ දී අධ්‍යයනය කළ යුතු කරුණු 02ක් ලියන්න. (ලකුණු 02)

(2) එහි දී ප්‍රමුඛතාවයන් දක්වන කාර්යයන් 02ක් ලියන්න. (ලකුණු 02)

(3) නර්තන ප්‍රසංගය සඳහා උචිත තේමාවක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

Department of Education – Western Province

(4) ප්‍රසංගය සඳහා ඉදිරිපත් කරන ප්‍රසංග අංග පෙළ ගැස්වීමක් කරන්න. (ලකුණු 02)

(5) එම ප්‍රසංගය සාර්ථක කර ගැනීමට ඔබ දක්වූ දායකත්වය පිළිබඳ කරුණු 02 දක්වන්න. (ලකුණු 02)

(02) (1) මාත්‍රා 3 තනි තිතට බෙර පදයක් / දවුල් පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

(2) ග්‍රහ පන්ති කවියක පද දෙකක් අදාළ තිත් රූපයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

(3) මාත්‍රා 3 + 4 දෙතිතට අයත් කස්තිරම / ඉරට්ටිය / කලාසම ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(03) (1) දඹදෙණිය හෝ කුරුණෑගල යුගයේ නර්තන කලාව පැවති බවට ගත හැකි සාහිත්‍ය මූලාශ්‍ර 02ක් ලියන්න. (ලකුණු 02)

(2) ඉන් එක් මූලාශ්‍රයක නර්තනය පිළිබඳව දක්වෙන තොරතුරු විස්තර කරන්න. (ලකුණු 04)

(3) දඹදෙණිය හෝ යාපහුව යුගයේ නර්තන කලාවට භරත නැටුමේ ආභාෂය පැවති බවට උදාහරණ 2ක් සපයන්න. (ලකුණු 04)

(04) (1) අතීතයේ දී තූර්ය වාදන යොදා ගත් අවස්ථා 02ක් දක්වන්න. (ලකුණු 02)

(2) වර්තමානයේ විවිධ කටයුතු සඳහා වාදනය යොදා ගන්නා අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(3) හේවිසි වාදනය සඳහා යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ ඇඳ නම් කරන්න. (ලකුණු 06)

Department of Education – Western Province